# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

# 2016

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

**முதியோர்களுக்கான தேசிய சபை**

National Council for Elders

**සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය**

**சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு**

Ministry of Social Empowerment & Welfare

# පටුන


පටුන....1

පූර්විකාව....2

විධායක වාර්තාව....3

හැඳින්වීම....4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය....5

දැක්ම....5

මෙහෙවර....5

සංවිධාන සැලැස්ම - 2016....6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2016....7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2016....8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2016....10

2016 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය....13

වැඩිහිටි නිවාස අලුත්වැඩියා සඳහා ආධාර සැපයීම....13

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2016....14

වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2016....15

රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2016....16

රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2016....16

ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන....17

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන....18

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2016....21

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය....22

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය....23

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති....25

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව....26

ආදායම් සහ වියදම් වාර්තාව....27

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය....28

උප ලේඛන....29

විගණකාධිපතිගේ මතය....33

විගණකාධිපති වාර්තාව....34

විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු....48

# පූර්විකාව

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ උන්නතිය උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය තීරණ උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව සකස් කරයි.

2016 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුහසාධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2016 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාවේ අරමුණයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව 2016 වර්ෂයේදී වැඩිහිටි ආත්මාභිමානය, ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර වඩාත් ඵලදායී සේවාවක් ඉටු කිරීමට ලැබීමද වාසනාවකි.

තවද වත්මන් රජයේ ජාතික ආණ්ඩුව යටතේ ද අතීත උරුමයේ කොටස්කරුවන් වූ වැඩිහිටියන් අතරින් අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් දෙදහසක ප්‍රදානයක් ලබා දෙමින් තෘප්තිමත් වැඩිහිටිවියක් උදෙසා කැපවීම සතුටට කරුණකි.

# විධායක වාර්තාව

2016 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය උදෙසා කැපවී ක්‍රියා කළ අතර ඒ නිසාම 2016 වසරේ සැලසුම් කළ පරිදිම සාර්ථක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වත්මන් රජයේ ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දෙදහසක ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර පැවති අභියෝග ජය ගැනීමට  සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ගරු අමාත්‍යතුමන් සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ මඟ-පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යය මණ්ඩලය මේ පිළිබඳව දක්වන ලද උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම  සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ලේකම්තුමන් ඇතුළු කාර්යය මණ්ඩලය ද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තුතිය හිමි විය යුතුය.

# හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදු වූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මරණ හා උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 14.6% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 21% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුහසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි. 2016 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, ස්වයං රැකියා සඳහා මුදල් ආධාර ලබාදීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලා වීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


# දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායී වැඩිහිටි දිවියක් උදාකිරීම


# මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්මපරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

# සංවිධාන සැලැස්ම - 2016



# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2016




| නම | තනතුර |
|---|---|
| **1.** මහින්ද සෙනවිරත්න | සභාපති |
| **2.** එස්.ඩී. උඩවත්ත මයා | උප සභාපති |
| **3.** සුවින්ද.එස්.සිංගප්පුලි මයා | ලේකම් |
| **4.** ප්‍රදීප් යසරත්න මයා | කමිටු සාමාජික |
| **5.** තිලක් ද සොයිසා මයා | කමිටු සාමාජික |
| **6.** මහින්ද රණසිංහ මයා | කමිටු සාමාජික |
| **7.** වසන්ත අබේරත්න ද සිල්වා මයා | කමිටු සාමාජික |
| **8.** වෛද්‍ය ආනන්ද ජයලාල් මයා | කමිටු සාමාජික |
| **9.** ආචාර්ය රිඩ්ලි ජයසිංහ මයා | කමිටු සාමාජික |
| **10.** මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මයා | කමිටු සාමාජික |
| **11.** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුධීර ජයවීර මයා | කමිටු සාමාජික |
| **12.** අධිනීතිඥ බී. ඩී මහිලාල් චන්දිම මයා | කමිටු සාමාජික |
| **13.** කේ.එම්.එස්.පී.බණ්ඩාර මයා | කමිටු සාමාජික |
| **14.** මාලර් ගන්ගාදරන් මහත්මිය | කමිටු සාමාජික |
| **15.** නීතිඥ කමල් අමරසිංහ මයා | කමිටු සාමාජික |
| **16.** ආචාර්ය නීලා පියසීලී ගුණසේකර මහත්මිය | කමිටු සාමාජික |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2016

2011 අංක 5 දරන පනතින් සංශෝධිත 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතෙහි 1 කොටසේ 2 (1) අනුව වැඩිහිටි තැනැත්තන් සදහා වූ ජාතික සභාව පිහිටුවා ඇති අතර එහි 10 වන වගන්තිය අනුව සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේදි ඊට සහය වීම සඳහා ජාතික මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 1 කොටසේ 12 හා 13 වන වගන්ති යටතේ සභාවේ ප්‍රධාන කර්තව්‍යයන් හා අනු කර්තව්‍යයන් හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය සම්බන්ධයෙන් සලකා බලන විට වයස්ගත ජනගහනය සිටින රටක් ලෙස ආසියානු කලාපීය රටවල් අතර ප්‍රධාන ස්ථානය බවට පත්වෙමින් තිබේ. වර්ෂ 2000 දී ශ්‍රී ලංකාවේ සෑම පුද්ගලයන් 10 දෙනෙකුට එක් අයෙකු වයස්ගත තත්ත්වයට ඇතුලත් වුවත් එය වසර 2030 වන විට සෑම පුද්ගලයන් 05 දෙනෙකුට එක් වැඩිහිටියකු ලෙසටත් 2040 වන විට සෑම පුද්ගලයන් 04 දෙනෙකුට එක් වැඩිහිටියෙකුත් වන ආකාරයට වැඩිහිටි ජනගහනය වර්ධනය වේගවත්ව සිදුවන බවට සංඛ්‍යා ලේඛනාත්මකව පෙන්වාදීම් සිදුකර ඇත.

2016 වර්ෂය පිළිබඳව සලකන විට ජාතික සභාව මගින් හඳුනාගත් යම් කිසි කාර්යභාරයක් ඉටුකර තිබෙන අතර ඒ සඳහා අදහස් හා යෝජනා ලබාදෙමින් කටයුතු කළ හිටපු සභාපතිවරයාට හා එහි සාමාජිකයන් වශයෙන් කටයුතු කළ සියලු දෙනාටම කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

තවද ජාතික සභාව විසින් අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රියාවට නංවමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2016 වර්ෂයේ ඉටුකර ඇති කාර්යභාරය පිළිබඳවද මෙහිදි ප්‍රසංශනාත්මකව සඳහන් කරමි. විශේෂයෙන්ම සීමාසහිත කාර්යමණ්ඩලයක් තුල මහලේකම් කාර්යාලය ප්‍රතිසංවිධානය කර ගත යුතුව තිබූ කාර්යන් පිළිබඳව අවධානය යොමුකර කාර්යසාධනයන් සහිතව කටයුතු කර තිබෙන බවද සඳහන් කරනු කැමැත්තෙමි.

2016 වර්ෂයත්, 2017 වර්ෂයත් සැලකිල්ලට ගනිමින් 2018 වර්ෂයේ සිට ඉදිරියට වැඩිහිටි ප්‍රජාව සම්බන්ධයෙන් ජාතික සභාව හා මහලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව කරුණු කිහිපයක් සඳහන් කරනු කැමැත්තෙමි.

තවද 2015 වසරේදි 14.6% වූ වැඩිහිටි ජනගහනය 2050 වර්ෂයේදි 28.6% වන බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නවතම සංඛ්‍යා දත්තවලින් පෙන්නුම් කර ඇත .

මෙවන් පසුබිමක් මත වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා යථෝක්ත පනතේ 12 වන වගන්තියේ සඳහන් ප්‍රධාන අරමුණ සහ 13 වන වගන්තියේ සඳහන් අනු අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසාත්, විශේෂයෙන්ම 2030 වර්ෂය වනවිට ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක සැලකීමේදි වැඩිහිටි ජනතාවගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට නව සැලසුම් හා උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතුව ඇත.

දැනටමත් අමාත්‍යාංශය මගින් 2018-2020 දක්වා අමාත්‍යාංශයේ සෑම විෂයක් සම්බන්ධයෙන්ම තුන්

අවුරුදු කාර්යසාධන වර්ධන උපාය මාර්ගික සැලැස්මක් සකස් කරමින් තිබේ.

එහිදි වැඩිහිටි මහලේකම් කාර්යාලයද එකී තුන් අවුරුදු සැලැස්මේ වැඩිහිටි ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම උදෙසා පනතේ 12 හා 13 වගන්තිවල අරමුණු කරා ළඟාවීමට නව උපාය මාර්ග රැසක් හඳුනාගෙන ඇත.

මෙම සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීමේදි වැඩිහිටියන්ට අවශ්‍ය අනිකුත් සේවාවන් සපයන රාජ්‍ය, ස්වෙච්ඡා සංවිධාන හා පෞද්ගලික අංශ සමඟ ඒකාබද්ධ ප්‍රවේශයකින් යුතුව කටයුතු කිරීමටද අපේක්ෂිතය.

වර්තමානය ගත් විට ලංකාව පුරා රජය මඟින් නඩත්තු කරනු ලබන වැඩිහිටි නිවාස 6ක් තිබෙන අතර,වෙනත් ස්වෙච්ඡා සංවිධාන හා පුණ්‍ය ආයතන මඟින් නඩත්තු කරන වැඩිහිටි නිවාස ගණන 300 කි මේ අනුව මුළු වැඩිහිටි නිවාස සංඛ්‍යාව 306 කි. වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් පවතින අවධානය වැඩිවීමත් සමග වැඩිහිටි රැකවරණය සැපයෙන මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩිකිරීමේ අවශ්‍යතාවයද පවති. ඉහත සඳහන් වැඩිහිටි නිවාස සියල්ලෙහි ජීවත්වන වැඩිහිටියන් සංඛ්‍යාව දළ වශයෙන් 7500 ක් පමණ වේ.

මීට අමතරව ප්‍රාදේශීය බලමණ්ඩල 281 ක් තිබෙන අතර ජාතික බල මණ්ඩලයන්ද ක්‍රියාත්මක වේ. මේවායෙන් වැඩිහිටියන් සම්බන්ධව ඉටුවන සේවාවන් උදෙසා සහය ලබාදෙමින් වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් ස්වෙච්ඡාවෙන් කැපවුන සේවාවන් සැපයීමට අවශ්‍ය වන රාජ්‍ය මැදිහත්වීමද වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සිදුවිය යුතුව ඇත. දැනට මෙම වැඩිහිටි නිවාස ලියාපදිංචි කිරීමක් සිදුවුවත් ඒවා නියාමනය කරමින් ඒවායෙන් ප්‍රමිතිගත සේවාවක් ලබා දීම සඳහා ක්‍රමවේද සකස් කළ යුතුව ඇත.

දිළිඳුභාවය නිසාත් වෙනත් සාමාජීය කරුණු වැඩිහිටි නිවාස ගත වීමට ඉල්ලුම් කරන සංඛ්‍යාවද වැඩි වී ඇත. වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් අවැසි සේවාවන් සැපයීම උදෙසා පුළුල් වැඩපිළිවෙලක් සකස් කිරීමේදි දැනට අනුමත ඉහත දැක්වූ කාර්යමණ්ඩලය කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා මෙම ආයතනය මානව සම්පත් අතින් ශක්තිමත් කිරීම සඳහාද කටයුතු කිරීමට අපේක්ෂිතය.

ඉහත දැක්වූ ආකාරයට යෝජිත නව සැලසුම් හා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිහිටි අරමුදලක් පිහිටුවා ඇති අතර එය තවදුරටත් මුල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට ශ්‍රී ලාංකිය හා විදේශ රටවල සිටින පරිත්‍යාගශීලීන්ගෙන්ද මුල්‍ය දායකත්වය ලබාගැනීමේ ව්‍යාපෘතියක්ද සකස් කර ඇත. මේ නිසා වැඩිහිටි ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය මුල්‍යමය ශක්තිය මෙම වැඩිහිටි අරමුදල තුලින් සපයා ගත හැකිවනු ඇත.

ඉහත දැක්වූ ආකාරයට 2016 වර්ෂය සාර්ථක කර ගැනීම උදෙසා සහ 2017 වර්ෂය හා ඉන් ඉදිරියට වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සුබසාධනය උදෙසා විෂය භාර අමාත්‍ය ගරු එස්.බී දිසානායක මැතිතුමාගෙන් සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු රන්ජන් රාමනායක මැතිතුමාගෙන් ලැබෙන නායකත්වය සහ මඟපෙන්වීම ද මෙහිලා කෘතවේදීව සිහිපත් කරනු කැමැත්තෙමි.

**ශිරාණි වීරකෝන්**
ලේකම්

සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට
උරුමය පිළිබඳ අමාත්‍යාංශය
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2016

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයේ අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

**1. රු. 2000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව**

වයස අවුරුදු 70 ඉක්ම වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය සහ සුභසාධනය සැලසීමේ අරමුණින් 2016 අයවැය යෝජනා යටතේ වැඩිහිටි සුභසාධනය සඳහා අතිරේක ප්‍රතිපාදන රජය විසින් වෙන් කර දෙන ලදී.

වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 386080 කට පමණ 2016 වර්ෂයේදී රු. 2000/- දීමනාව ලබා දී ඇත.

**2. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූල්‍යාධාර සැපයීම.**

ග්‍රාමීය වැඩිහිටි කමිටු 325 ක් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 03 ක් ද, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 01 ක් හා උතුරු පලාත් රැස්වීම් 01ක්, උතුරු නැගෙනහිර පළාත් ආගමික වැඩසටහන හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 17 ක් සඳහා ලිපි ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් ද, රුපියල් මිලියන 1.999 ක මුදලක් වැය කොට ඇත.

**3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

වර්ෂය තුළ රුපියල් මිලියන 0.600 ක වියදමක් දරා වැඩිහිටියන් 61791 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

**4. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

ග්‍රාමීය කාන්තා සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් 121 ක් ද, පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 120 ක් ද, දිස්ත්‍රික් කමිටු දැනුවත් කිරීම් 01 ක් ද, රු 2000 දීමනාව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් 01 ක් ද, මිත්‍රත්ව හුවමාරු වැඩසටහන් 01 ක් ද,ගෘහස්ථ සාත්තු සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් ද, ගෘහස්ථ සාත්තු සේවක පුහුණු වැඩසටහන - **NVQ** - 02 මට්ටම ද, විශ්‍රාම පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් ද, අනුලා අභිමාන ප්‍රදර්ශනය තුළ පාසල් ළමුන් දැනුවත් කිරීම හා වැඩිහිටි අත්කම් ප්‍රදර්ශනය ද, ගෘහස්ත සාත්තු සේවකයන් වෙනුවෙන් ටී ෂර්ට් 90 ක් ද, ගෘහස්ථ සාත්තු සේවක හැඳුනුම්පත් 30 ක් ද, ව්‍යායාම **CD** වෙනුවෙන් ද රු.මිලියන 5.500 ක මුදලක් වැය කොට ඇත.

**5. නොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම.**

2016 වර්ෂය තුළ වැඩිහිටියන් 3693 දෙනෙකුට වෛද්‍ය නිර්දේශයන්ට අනුව අක්ෂිකාච නිකුත් කර ඇති අතර, 489 දෙනෙකුට ශ්‍රවන උපකරණ ලබා දී තිබේ. වැය වූ මුදල රුපියල් මිලියන 9. 998 කි.

**6. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"වැඩිහිටි අයිතිවාසිකම් සුරක්ෂිත හෙටක්" යන තේමාව යටතේ 2016 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2016.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන්ගේ සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර,එම උත්සවයට සමගාමීව අවුරුදු සියයට වැඩි වැඩිහිටියන් පිදීම, අවුරුදු 75 ට වැඩි හා වැඩිම දරුවන් ප්‍රමාණයක් සිටින දෙමාපියන් පිදීම,පාසල් දරුවන් අතර පැවති චිත්‍ර තරඟය ආදි විවිධ අංගයන් පවත්වන ලද අතර ඒ සියල්ල සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 11 කි.

***7.* වැඩිහිටි නිවාසවලට මූලාධාර ලබාදීම.**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය සහ සංචාරක නිකේතනය ද මාලිගාතැන්න එච්පීන් නෝනා අනුස්මරණ වැඩිහිටි නිවාසය ද ඇතුලත්ව වැඩිහිටි නිවාස 14ක් සංවර්ධනය කිරීම් සඳහා රුපියල් මිලියන 13.580 ක මුදලක් වැයකර තිබේ.

**8. වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන**

දානපතියන්ගේ පරිත්‍යාග තුළින් 2016 වර්ෂයේදී එක් අයෙකුට මසකට රු. 500/- ක් වන පරිදි වැඩිහිටියන් 10 දෙනෙකුට ද, රු.250 බැගින් වැඩිහිටියන් 35 දෙනෙකුට ද අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

**9. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලය 52 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගේ පැමිණිලි 130 ක් අතරින් පැමිණිලි 90 ක් විසඳා අවසන් කරන ලදී. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2016 වර්ෂයේදී රුපියල් මිලියන 1**.055** ක් වැය කොට ඇත.

**10. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

2016 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 12ක් පවත්වා ඇති අතර විගනන හා කළමනාකරණ කමිටු රැස්වීම් 05 ක් ද පවත්වා ඇති අතර වැය වූ මුදල රුපියල් මිලියන 0**.903** කි

**11. ප්‍රකාශන**

**2016** වර්ෂය තුලදි වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් 4000 ක් මුද්‍රනය (2000 අංක 09 දරන පනත් 2000 - සිංහල හා 2011 අංක 5 දරන පනත් 2000- සිංහල බැගින්), වැඩිහිටි සඟරාව පිටපත් 2000 මුද්‍රනය, වැඩිහිටි අත්පොත් 5000 ක් මුද්‍රනය කිරීමාදිය සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් වැය වී ඇති සමස්ත මුදල රු.මිලියන 1.400 කි.

**12. ස්වයං රැකියා ආධාර ලබා දීම.**

වයස අවුරුදු 60ට වැඩි අඩු ආදායම්ලාභි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයං රැකියා සඳහා

ආධාර ලබා දීම සිදු කරන අතර එය උපරිමය රු.20000 කට යටත්ව ප්‍රදානය කරනු ලැබේ.මේ යටතේ 2016 වර්ෂයේදි ප්‍රතිලාභීන් 209 දෙනෙක් අතරේ රු මිලියන 3.995 ක මුදලක් පිරිනමා ඇත.

2016 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 22 ක් ද පුනරාවර්ථන වියදම් යටතේ රු. 125 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 22 ක් හා රු. මිලියන 124.999 පමණි. කෙසේ නමුත්, 2016 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 128**.967** ක මුදලක් ද ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 24.781 ක් වැඩිහිටි සුබසාධන කටයුතු සඳහා සෘජුව වැය කර ඇත.

සුවින්ද.එස්.සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# 2016 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

## වැඩිහිටි නිවාස අලුත්වැඩියා සඳහා ආධාර සැපයීම.

| *දිස්ත්‍රික්කය* | *වැඩිහිටි නිවාසය* | *ගෙවන ලද මුදල (රු)* |
|---|---|---|
| මාතර | පිටබැද්දර දෑරංගල වැඩිහිටි නිවාසය | 2,646,828.17 |
| මාතලේ | ඉඹුලන්දණ්ඩ වැඩිහිටි නිවාසය | 262,000.00 |
| | ගුරුළුපොත සරණ වැඩිහිටි නිවාසය | 611,850.00 |
| මහනුවර | උඩුනුවර වැඩිහිටි නිවාසය | 1,509,000.00 |
| | බෝපිටිය වැඩිහිටි නිවාසය | 2,058,153.02 |
| පොළොන්නරුව | මැදිරිගිරිය මාපිය සෙවණ වැඩිහිටි නිවාසය | 241,657.00 |
| | පැරකුම් වැඩිහිටි නිවාසය | 574,469.20 |
| පුත්තලම | නාත්තන්ඩිය ජ්‍යෙෂ්ඨ පුරවැසි බලමණ්ඩලය | 562,082.74 |
| ගාල්ල | රත්ගම වැඩිහිටි නිවාසය | 2,500,000.00 |
| ගම්පහ | ජයවර්ධන සමරු වැඩිහිටි නිවාසය | 48,875.00 |
| | මීරිගම වැඩිහිටි දිවා මධ්‍යස්ථානය | 100,000.00 |
| | බටහිර වැලිවේරිය වැඩිහිටි සමිති ගොඩනැගිල්ල | 934,357.81 |
| කුරුණෑගල | කොටවෙහෙර දිවා සුරකුම් මධ්‍යස්ථානය | 39,934.53 |
| | ***එකතුව*** | **12,089,207.47** |
| | මල්වතුහිරිපිටිය වැඩිහිටි නිවාසයේ හා කතරගම වැඩිහිටි නිවාසයේ නඩත්තු වියදම් | 1,518,792.53 |
| | **මුළු වියදම** | **13,580,000.00** |
| | | |

# වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2016

| පළාත | දිස්ත්‍රික්කය | හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 3380 |
| | කොළඹ | 3490 |
| | ගම්පහ | 8254 |
| මධ්‍යම | මාතලේ | 1289 |
| | නුවරඑළිය | 1584 |
| | මහනුවර | 3652 |
| දකුණ | හම්බන්තොට | 1805 |
| | ගාල්ල | 5440 |
| | මාතර | 2265 |
| නැගෙනහිර | මඩකලපුව | 1204 |
| | අම්පාර | 1802 |
| | ත්‍රිකුණාමලය | 927 |
| වයඹ | කුරුණෑගල | 3959 |
| | පුත්තලම | 1521 |
| උතුරු මැද | අනුරාධපුර | 3940 |
| | පොළොන්නරුව | 1336 |
| ඌව | බදුල්ල | 2698 |
| | මොණරාගල | 617 |
| සබරගමුව | රත්නපුර | 4664 |
| | කෑගල්ල | 3101 |
| උතුර | යාපනය | 1268 |
| | මන්නාරම | 579 |
| | මුලතිව් | 535 |
| | කිලිනොච්චි | 347 |
| | වවුනියාව | 571 |
| **එකතුව** | | **60228** |
| ප්‍රධාන කාර්යාලයෙන් ජංගම සේවාවලදී නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව | | 1563 |
| **නිකුත් කළ මුළු හැඳුනුම්පත් ගණන** | | 61791 |

# වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2016

| පළාත | දිස්ත්‍රික්කය | රු 5000 ආධාර ලබාදුන් කමිටු සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 4 |
| | කොළඹ | 6 |
| | ගම්පහ | 8 |
| මධ්‍යම | මහනුවර | 53 |
| | මාතලේ | 25 |
| | නුවරඑළිය | 41 |
| දකුණ | ගාල්ල | 07 |
| | මාතර | 06 |
| | හම්බන්තොට | 16 |
| උතුර | යාපනය | 27 |
| | වවුනියාව | 05 |
| නැගෙනහිර | මඩකලපුව | 14 |
| | අම්පාර | 52 |
| | ත්‍රිකුණාමලය | 28 |
| වයඹ | පුත්තලම | 10 |
| | කුරුණෑගල | 07 |
| සබරගමුව | රත්නපුර | 01 |
| | කෑගල්ල | 07 |
| ඌව | බදුල්ල | 04 |
| උතුරු මැද | අනුරාධපුර | 04 |
| ***එකතුව*** | | **325** |

## රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2016

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
|---|---|---|
| දකුණ | හම්බන්තොට | 01 |
| සබරගමුව | රත්නපුර | 01 |
| නැගෙනහිර | අම්පාර | 01 |
| **එකතුව** | | 03 |

## රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2016

| පළාත | දිස්ත්‍රික්කය | බලමණ්ඩල ගණන |
|---|---|---|
| මධ්‍යම | මාතලේ | 01 |
| **එකතුව** | | **01** |

## ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාර සේවා ලබාදීමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරා ගන්නා ලද 150 ක පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳ සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විට විශේෂයෙන්ම බස්නාහිර පළාත තුල ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබා ගැනීමට මාහැඟි අවස්ථාවක් උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු.750.00 බැගින් ද රාත්‍රි වැඩමුරයකට රු.900.00 බැගින් ද හා පැය 24 ක වැඩමුරයකට රු.1650.00 ක නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි සේවාදායකයකු ලබාගත හැක. එසේම සේවයේ යොදවන සියලු වැඩිහිටි සත්කාරකයන් ආචාරධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැළසුම්කර මෙහෙයවන අතර පුහුණුව සාර්ථකව අවසන් කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වෙච්ඡා සේවකයන්ගේ සේවය තුළින් ලබා ගැනීමට හැකි වී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයෙකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකි වීම නිසා වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවක පුහුණුව ලැබූවන්හට ද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත්වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටියන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස් කර තිබේ.

## වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 4 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී/සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදිමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිමට කැමති අයෙකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.

මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2016 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 01 | ලෙනාඩ් රෝහණ මහතා | 01 | එම්.පී වයලට් මිය | තඹුත්තේගම |
| 02 | ඩබ්.එම් වත්සලා මිය | 01 | පී අස්පත්තිනියේ මිය | පාතදුම්බර |
| 03 | එම්.එස්. එම්.අෂ්රොෆ් මයා | 07 | එන් ජේපින් මිය | මිනුවන්ගොඩ |
| | | | ඩබ්.පී. ගුණවති මිය | කුණ්ඩසාලේ |
| | | | ටී.ඩබ්.පී. අංගෝ මිය | මාවනැල්ල |
| | | | බී.ඩී. ජේන්නෝනා මිය | රිදීගම |
| | | | ආර්.ඒ. කැරලයින් නෝනා මිය | මිහින්තලය |
| | | | ඩී.එම්.ඩිංගිරි අම්මාමිය | මාස්පොත |
| | | | අයි.ඇන්සි නෝනා මිය | කැලණිය |
| 04 | ප්‍රේමා ගුණදාස මිය උදයාංගනි ගුණදාස මිය | 02 | එම්.කේ.ඒ සෝමා ගුණවර්ධන මිය | මිනුවන්ගොඩ |
| | | | එච්.පී විපුලසේන මයා | මිනුවන්ගොඩ |
| 05 | ඒ.බී පෙරේරා මිය | 01 | එම්.ඒ සේනං සිංඥා මයා | අත්තනගල්ල |
| 06 | ගිණුම | 26 | පී.එම් ලිලී මිය | |
| | | | කේ.ඒ පොඩිහාමිනේ මිය | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| | | | ඒ.අන්තෝනි මහතා | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| | | | ඊ.වයලට් මිය | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| | | | කේ. මේරි නෝනා | කැස්බෑව |
| | | | එම්.නෝබට් විමලසේන මයා | කැස්බෑව |
| | | | ආර්.ඇසිලින් නෝනා මිය | කඩුවෙල |
| | | | ඊ.පියසීලි මිය | කඩුවෙල |
| | | | එස්.ඒ කරුණාරත්න මයා | කඩුවෙල |
| | | | ඒ.හේමපාල පෙරේරා මයා | මහරගම |
| | | | ඩබ්.ඩී.ධර්මදාස මයා | මහරගම |
| | | | යසවතී වෙත්තසිංහ මිය | මහරගම |
| | | | එම්.ඒ හේමලතා පෙරේරා මිය | මහරගම |
| | | | ඇන්ටන් ඩෙන්සිල් මිරාල් මයා | මීගමුව |
| | | | ජේ.එල් ඇග්නස් ප්‍රනාන්දු මයා | මීගමුව |
| | | | පී.ඒ පියසේන මයා | |
| | | | එච්.ඩී ලීලාවතී මිය | මහකුඹුක්කඩවල |
| | | | එච්.ඩී. මැණික්හාමි මිය | ගිරිබාව |
| | | | ආර්.සී විනී මිය | ගිරිබාව |

| | | | | |
|---|---|---|---|---|
| | | | කේ.ආර්.ඩිංගිරි මයා | පොල්ගහවෙල |
| | | | ආර්.පී.ඩී උක්කු මිය | පදුවස්නුවර |
| | | | එච්.එම් හේරත් මැණිකේ මිය | ඉබ්බාගමුව |
| | | | ඒ.පී ධර්මවර්ධන මයා | දැරණියගල |
| | | | එස් හුරතලී මිය | කොලොන්න |
| | | | අයි.පී සොයිදා මිය | වරකාපොල |
| | | | ජේ.පී ලැයිසා මිය | වරකාපොල |
| 07 | ශාන්ති ටින්ටඩ් මිය | 01 | පී.ආර් සාදිනෝනා මිය | වරකාපොල |
| 08 | ලලනි පෙරේරා | 02 | ඩබ්. දිනුහාමි මිය | පොල්පිතිගම |
| | | | කේ.එම්.බණ්ඩාර මැණිකේ මිය | පාතහේවාහැට |
| 09 | අනුරාධා ජයමාලි මිය | 01 | එස්.ඩබ්. පීරිස් ස්ටීවන් ප්‍රනාන්දු මයා | චාවකච්චේරි |
| 10 | රානි කීර්ති ශ්‍රී | 02 | වර්ණපුලිගේ නන්දදාස | සීතාවක |
| | | | පනවැන්නගේ ප්‍රීතිලතා මිය | සීතාවක |
| 11 | කේ.එන්.කුමාරි සෝමරත්න | 01 | එච්.කුසුම් පෙරේරා මිය | සීතාවක |

# කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2016

| මාසය | කාමර වෙන් කළ ප්‍රමාණය | ආදායම රු. | වියදම් | | |
|---|---|---|---|---|---|
| | | | ජල බිල්පත් රු. | විදුලි බිල්පත් රු. | වෙනත් |
| ජනවාරි | | | 4,496.87 | 606.00 | - |
| පෙබරවාරි | | | 7,447.48 | 606.00 | - |
| මාර්තු | 11 | 13,200.00 | 7,425.87 | 642.60 | - |
| අප්‍රේල් | 09 | 9,000.00 | 11,953.73 | 789.30 | - |
| මැයි | 19 | 20,200.00 | 13,351.23 | 752.40 | - |
| ජූනි | 14 | 23,200.00 | 8,072.19 | 789.90 | - |
| ජූලි | 11 | 11,500.00 | 11,612.54 | 1,777.20 | - |
| අගෝස්තු | 67 | 71,100.00 | 14,215.72 | 3,094.80 | - |
| සැප්තැම්බර් | 47 | 45,500.00 | 13,085.53 | 4,869.90 | 2,960,694.00 |
| ඔක්තෝබර් | 35 | 27,500.00 | 11,361.19 | 2,707.80 | 81,710.00 |
| නොවැම්බර් | - | - | 6,807.25 | 1,466.10 | |
| දෙසැම්බර් | - | - | 10,246.86 | 569.40 | 1,751,697.54 |
| *2016 තුළ ප්‍රධාන කාර්යාලය මගින් කරන ලද වෙන් කිරීම්* | *38* | 38,400.00 | - | - | - |
| ***එකතුව*** | | ***259,600.00*** | ***120,076.46*** | ***18,670.05*** | ***4,794,101.54*** |

# ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත් කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්මවූ තම දරුවන් ඥාතීන් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කර ගනු ලබන අතර, දිගු කාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් වෙත ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරයි.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රුපියල් 500/- බැගින් ප්‍රතිලාභීන් 55 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබා දෙන ලදී.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්ය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්ම වූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුනු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපීම් අවශ්‍යතා ආදී සියළු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද **(Adoped Child)** නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24**(I)** වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටළු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝගය නඩත්තු අඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2016

| | |
|---|---|
| 2016 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි | - 130 |
| ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි | - 14 |
| ඒ අනුව අවසානය තෙක් විභාග කළ පැමිණිලි | 116 |

| | | |
|---|---|---|
| මණ්ඩලය විසින් සමථයට පත් කළ පැමිණිලි | - 90 | 116 |
| විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කළ හා ඉඩ ලබා දිය නොහැකි පැමිණිලි | - 10 | |
| ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි | - 04 | |
| දැනට විභාග වෙමින් පවතින පැමිණිලි | - 12 | |

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

සභාපති - ඩඩ්ලි කරුණාරත්න මයා

ලේකම් - එම්. පී. පුංචිබණ්ඩා මයා

**මණ්ඩලයේ සාමාජික**

1. ඩී.එල්.ආර්. සුහසිංහ මයා
2. ආචාර්ය ලීල් ගුණසේකර මයා
3. කේ. මර්කණ්ඩු මයා
4. ඒ. ආර්. ඒ. එම්. ලාෆීර් මයා

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

**පොදු ගිණුම් ප්‍රතිපත්ති**

(අ) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව පිළියෙළ කර ඇත.

(ආ) උපචිත පදනම මත සකස් කර ඇත.

(ඇ) රජයේ ප්‍රදානයන්

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය වෙළඳ නොවන ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලබයි.

මහාභාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කෙරේ.

**ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්.**

(අ) ක්ෂය ප්‍රතිපත්ති

I. මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

II. පහත පරිදි සරළ මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| ඉදිකිරීම් | - | 04% |
| වාහන සඳහා | - | 10% |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සඳහා | - | 15% |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා | - | 20% |

(ආ) ප්‍රාග්ධන හා පුනරාවර්ථන මුදල් ලැබීම් මූල්‍ය වාර්තාව තුළ ඇතුළත් කොට ඇත.

(ඇ) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම්වලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී.

ඇමුණුම - 1 ඒ

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| විස්තරය | සටහන | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 1 | 42,799,797.33 | 5,018,513.47 |
| සේවක ණය | 2 | 4,059,118.00 | 3,952,557.00 |
| ලැබිය යුතු ආදායම් | 21 | 754,041.30 | 881,000.00 |
| නොපියවූ උත්සව අත්තිකාරම් | 3 | 7,500.00 | 6,250.00 |
| පරිලේඛන/බඩු තොග | 4 | 533,708.81 | 708,085.30 |
| | | 48,154,165.44 | 10,566,405.77 |
| **ස්ථාවර වත්කම්** | | | |
| ආයෝජන - ස්ථාවර තැන්පතු ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | 6,974,959.28 | 6,974,959.28 |
| ස්ථාවර තැන්පතු ලංකා බැංකුව | | 389,000,000.00 | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 11,232,078.00 | 10,516,235.67 |
| වාහන | | 11,486,000.00 | 13,640,500.00 |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | | 12,273,592.74 | 4,949,242.41 |
| ඉදිකිරීම් | | 7,338,953.00 | - |
| ඉඩම් | | 13,000,000.00 | 13,000,000.00 |
| | | 451,305,583.33 | 49,080,937.36 |
| **මුළු වත්කම්** | | 499,459,748.77 | 59,647,343.13 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | | 311,033.79 | 186,319.88 |
| පොදු තැන්පත් | 5 | 1,866,920.41 | 4,020,208·87 |
| විගණන ගාස්තු වෙන්කිරීම් | 6 | 80,000.00 | 80,000.00 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල | | 737,992.40 | 572,022.56 |
| පාරිතෝසිත වෙන්කිරීම් | 7 | 12,446,286.50 | 10,720,215.00 |
| රාජ්‍ය ආයතන සඳහා ගෙවීම | 8 | 293,600.00 | - |
| වැඩිහිටි ආරක්ෂණ අරමුදල | | 427,704,100.00 | - |
| වැඩිහිටි ආවරණ කැපකරු අරමුදල | 9 | 214,187.76 | 324,187.76 |
| | | 443,654,120.86 | 15,902,954.07 |
| **ජංගම නොවන වගකීම්** | | - | - |
| **මුළු වත්කම්** | | 55,805,627.91 | 43,744,389.06 |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| රජයේ ප්‍රදානයන් - (මූලධන) | 10 | 54,816,763.15 | 44,661,773.68 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 11 | 13,000,000.00 | 13,000,000.00 |
| සමුච්චිත අතිරික්තය/හිගය | 12 | (12,011,135.24) | (13,917,384.62) |
| **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** | | 55,805,627.91 | 43,744,389.06 |

අත්සන් කළේ,
මහින්ද සෙනවිරත්න
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 බී

### වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් සහ වියදම් වාර්තාව

| විස්තරය | සටහන | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 20 | 126,925,495.02 | 134,003,961.59 |
| වෙනත් ආදායම් | | 4,667,918.46 | 1,468,905.97 |
| ක්‍රමක්ෂය | | 9,630,951.51 | - |
| **මුළු ආදායම්** | | 141,224,364.99 | 135,472,867.56 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩි නඩි | 13 | 66,025,931.68 | 54,989,855.75 |
| ගමන් වියදම් | 14 | 1,759,165.82 | 1,908,541.00 |
| සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 15 | 2,667,439.03 | 1,580,016.38 |
| නඩත්තු වියදම් | 16 | 1,770,885.91 | 2,453,787.18 |
| ගිවිසුම්ගත සේවා | 17 | 3,292,911.09 | 3,817,027.91 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 18 | 55,260,549.49 | 66,657,324.83 |
| ක්ෂය ප්‍රමාණය | 19 | 9,630,951.51 | 6,444,895.19 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | 140,407,834.53 | 137,851,448.24 |
| **අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය** | | 816,530.46 | (2,378,580.68) |

අත්සන් කළේ,
මහින්ද සෙනවිරත්න
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ අරමුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාවලි අතිරික්තය/ඌණතාවය | **816,530.46** | **(2,378,580.68)** |
| **මූල්‍යමය නොවන කාර්යයන්** | | |
| ක්ෂය වීම් | **9,630,951.51** | **6,044,895.19** |
| ක්‍රමක්ෂය | **(9,630,951.51)** | **-** |
| **ජංගම වත්කම්** | | |
| වර්ෂ අවසාන තොග වැඩිවීම | **174,376.49** | **(77,269.81)** |
| **ජංගම වගකීම්** | | |
| පාරිතෝෂික | **1,726,071.50** | **1,272,924.00** |
| සේවක ණය ඉතිරියේ වැඩිවීම | **(106,561.00)** | **146,495.16** |
| නොපියවූ උත්සව අත්තිකාරම් අඩුවීම | **(1,250.00)** | **34,750.00** |
| ස්ථාවර වත්කම් පොලී වැඩිවීම | **(389,000,000.00)** | **(486,625.05)** |
| ලැබිය යුතු බැංකු ගාස්තු | **-** | **50,000.00** |
| ලැබිය යුතු වාහන විකිණුම් ආදායම් | 881,000.00 | (881,000.00) |
| ලැබිය යුතු කොඩි විකිණුම් ආදායම් | (754,041.30) | - |
| විගණන ගාස්තු වෙන්කිරීම් වැඩිවීම | - | - |
| සේවක ණය අරමුදල වැඩිවීම | 165,969.84 | 357,367.00 |
| පොදු තැන්පත්වල අඩුවීම | **2,153,288.46** | **301,716.06** |
| උපචිත වියදම්වල අඩුවීම | **124,713.91** | **125,598.08** |
| **WHO** අරමුදල | **-** | **(104,613.52)** |
| පසුගිය වසරේ ගැලපුම් කිරීම් | **1,089,718.92** | **(2,455,659.00)** |
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **387,036,759.64** | **(1,235,263.43)** |
| **ආයෝජන කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| දේපල, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම්වල මිළදී ගැනීම් | **(22,855,597.48)** | **(14,991,038.41)** |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **22,855,597.48** | **14,991,038.41** |

| | | |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන - (මූලධන) | **19,785,940.98** | **9,996,038.41** |
| භාණ්ඩාගාරයේ ප්‍රදාන - (වාහන) | **-** | **5,795,000.00** |
| වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | **(110,000.00)** | **(38,000.00)** |
| රාජ්‍ය ආයතනවලට ගෙවීම | **293,600.00** | **-** |
| වැඩිහිටි ආරක්ෂණ අරමුදල | **427,704,100.00** | |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **447,673,640.98** | **15,753,038.41** |
| මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ ඉහලයාම | **37,781,283.86** | **1,997,263.43** |
| කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | **5,018,513.47** | **3,021,250.04** |
| කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | **42,799,797.33** | **5,018,513.47** |

අත්සන් කළේ,
මහින්ද සෙනවිරත්න
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# උප ලේඛන

| 2015 | සටහන් 11 | ප්‍රාග්ධන ප්‍රදාන | 31/12/2016 රු. |
|---|---|---|---|
| **13,000,000.00** | | ඉඩම | **13,000,000.00** |
| **13,000,000.00** | | එකතුව | **13,000,000.00** |

| 2015 | සටහන් 12 | සමුච්චිත අඩු වැඩි වීම | 31/12/2016 රු. |
|---|---|---|---|
| **(9,083,144.94)** | | ආරම්භක ශේෂය | **(13,917,384.62)** |
| **(2,455,659.00)** | | පෙර වර්ෂයට ගැලපුම | **1,089,718.92** |
| **(2,378,580.68)** | | අතිරික්ත ඌනතාවය/අතිරික්තය | **816,530.46** |
| **13,917,384.62** | | **එකතුව** | **(12,011,135.24)** |

| 2015 | සටහන් 13 | පුද්ගලික පඩි නඩි | 31/12/2016 රු. |
|---|---|---|---|
| 23,277,607.29 | | වැටුප් හා වේතන | 28,211,621.43 |
| 3,738,555.07 | | සේවක අර්ථසාදක අරමුදල | 4,355,437.60 |
| 934,638.60 | | සේවක භාරකාර අරමුදල | 1,081,900.98 |
| 491,000.71 | | අතිකාල | 497,351.36 |
| 79,214.00 | | නිවාඩු දින වැටුප් | 125,181.05 |
| 10,197,140.00 | | ජීවන වියදම් දීමනා | 11,468,517.07 |
| 16,271,700.08 | | අන්තර් දීමනා | 18,292,492.19 |
| 0 | | පාරිතෝෂික | 1,993,430.00 |
| 54,989,855.75 | | **එකතුව** | 66,025,931.68 |

| 2015 | සටහන් 14 | | ගමන් වියදම් | 31/12/2016 රු. |
|---|---|---|---|---|
| 1,908,541.00 | | (I) | දේශීය | 1,360,811.10 |
| - | | (II) | විදේශීය | 398,354.72 |
| 1,908,541.00 | | | **එකතුව** | 1,759,165.82 |

| 2015 | සටහන් 15 | | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 31/12/2016 රු. |
|---|---|---|---|---|
| 920,688.02 | | (I) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,704,044.23 |
| 643,328.36 | | (II) | ඉන්ධන හා ලිහිසි තෙල් | 939,394.80 |
| 16,000.00 | | (III) | නිල ඇඳුම් | 24,000.00 |
| 1,580,016.38 | | | **එකතුව** | 2,667,439.03 |

| 2015 | සටහන් 16 | | නඩත්තු වියදම් | 31/12/2016 රු. |
|---|---|---|---|---|
| 2,221,756.98 | | (I) | වාහන | 1,350,777.35 |
| 232,030.20 | | (II) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 420,108.56 |
| 2,453,787.18 | | | එකතුව | 1,770,885.91 |

| 2015 | සටහන් 17 | | ගිවිසුම් සේවා | 31/12/2016 රු. |
|---|---|---|---|---|
| 199,384.00 | | (I) | ප්‍රවාහන | 183,727.79 |
| 705,406.40 | | (II) | තැපැල් හා විදුලි සංදේශ සේවා | 852,379.81 |
| 799,534.98 | | (III) | විදුලිය | 1,630,725.31 |
| 266,972.16 | | (IV) | පිරිසිදු කිරීමේ ගාස්තු | 272,313.68 |
| 29,618.50 | | (V) | පුවත්පත් | 32,358.00 |
| 32,941.00 | | (VI) | සංග්‍රහ වියදම් | 69,628.00 |
| 35,631.00 | | (VII) | විගණන ගාස්තු | 21,949.00 |
| 468,615.87 | | (VIII) | අනෙකුත් දීමනා | 221,329.50 |
| 6,000.00 | | (IX) | බැංකු ගාස්තු | 8,500.00 |
| 1,272,924.00 | | (XI) | පාරිතෝෂිකය | - |
| 3,817,027.91 | | | එකතුව | 3,292,911.09 |

| 2015 | සටහන් 18 | | වෙනත් මෙහෙයුම් වියදම් | 31/13/2016 රු. |
|---|---|---|---|---|
| 2,942,367.00 | | (I) | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 1,998,600.00 |
| 800,365.00 | | (II) | හැදුනුම්පත් නිකුත් කිරීම | 601,553.15 |
| 1,990,570.00 | | (III) | දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබා දීම | 3,995,431.00 |
| 1,798,071.00 | | (IV) | ප්‍රකාශන | 1,640,058.50 |
| 9,974,448.50 | | (V) | පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 5,496,372.14 |
| 11,846,330.00 | | (VI) | වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම | 9,998,415.00 |
| 10,058,794.01 | | (VII) | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | 10,881,796.35 |
| 8,128,448.76 | | (VIII) | වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | 13,607,794.09 |
| 383,868.50 | | (IX) | ජාතික සභා සාමාජික දීමනා | 1,049,580.00 |
| 929,470.50 | | (X) | නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | 892,097.00 |
| 2,912,365.60 | | (XI) | 2000/-දීමනාවේ පරිපාලනමය වියදම් | 2,923,057.24 |
| - | | (XII) | පිළිකා රෝගීන් සඳහා ආධාර | 250,000.00 |
| 10,850,471.73 | | (XIII) | වැඩිහිටි නිවාස අලුත්වැඩියා සහ නඩත්තු | - |
| 4,041,754.23 | | (XIV) | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 1,925,795.02 |
| 66,657,324.83 | | | එකතුව | 55,260,549.49 |

| 2015 | සටහන් 19 | | ක්ෂය ප්‍රමාණය | 31/12/2016 රු. |
|---|---|---|---|---|
| 2,617,518.09 | | (I) | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,064,472.88 |
| 2,154,500.00 | | (II) | වාහන | 2,154,500.00 |
| 1,672,877.10 | | (III) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 4,106,188.92 |
| - | | (IV) | ඉදිකිරීම් | 305,789.71 |
| 6,444,895.19 | | | එකතුව | 9,630,951.51 |

# විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්ථාවක් සභාවේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

# තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන )

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ්/ සී/එන්සීර්/1/16/21 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 අගෝස්තු 04 දින

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්. වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික සඳහා වූ ප්‍රතිපාදනය රු.262,792 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කතරගම සංචාරක නිවාසයේ වැඩිදියුණුකිරීම් සහ උද්‍යාන අලංකරණය වෙනුවෙන් මොණරාගල ප්‍රාදේශීය ලේකම් වෙත ප්‍රේෂණය කර තිබූ රු.4,712,391 ක් කෙරීගෙනයන වැඩ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කිරීම නිසා ගොඩනැගිලි වටිනාකම රු.4,712,391 කින් සහ ක්ෂය රු.188,496 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් කතරගම වැඩිහිටි නිවාසය, කතරගම සංචාරක නිකේතනය, මාළිගාතැන්න වැඩිහිටි නිවාසය සහ නිවිතිගල තිල්වලා සෙවන ආබාධිත මධ්‍යස්ථානයන්ට අයත් ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදෙන අවස්ථාවේදීම ඒවා අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් ඉකුත් වර්ෂයේදී එසේ ලබාදුන් මුදලින් වියදම් නොවී ආපසු එවන ලද රු.801,455 ක් සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඉ) විවිධ තැන්පත් අරමුදලින් පරිගණක හා උපාංග මිළදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.3.266.010 ක් වැයකර තිබුණු අතර ඒ සඳහා රු.653.202 ක්වූ ක්ෂය සදොස් ලෙස භාණ්ඩාගාර ප්‍රදාන ගිණුමට හර කර විලම්භිත ආදායමක් ලෙස ආදායමට බැර කර තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වෙනත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන මගින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස 07 ක අළුත්වැඩියා කටයුතු සඳහා රු.8.023.224 ක් ලබාදී තිබුණි. කෙසේ වුවද, මෙම අළුත්වැඩියා කටයුතු සඳහා දරන ලද වියදම් සනාථ කිරීමට අදාලවූ බිල්පත් සහ ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවිය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3(අ) ඡේදය | සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කලයුතු නමුත් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීම් සහ මිලදී ගැනීම් 4 ක් සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක IAI / 2002/02 | සභාවට අයත් රු.10.472.700 ක් වටිනා පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.816,530 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,378,580 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,195,110 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ සේවක පාරිශ්‍රමික රු.11,036,076 කින් වැඩිවී තිබුණද අනෙකුත් ආදායම් රු.3,199,012 කින් වැඩිවීම, සහ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.11,396,776 කින් අඩුවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

4.1.1 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තියට අනුව, ඉටුකළයුතු කර්තව්‍යයන් 16 ක් දක්වා තිබුණ ද ඉන් 09 ක් පමණක් ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකර තිබූ අතර පහත සඳහන් කාර්යයන් 07 ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතන වලට වැඩසටහන් නිර්දේශ කිරීම.

(ආ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම.

(ඇ) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනා ගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්දනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාශ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(ඈ) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම.

(ඉ) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නඟාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

(ඊ) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

(උ) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර කිරීම සහ මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුළත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

4.1.2 ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබූ කර්තව්‍යයන් 09 සඳහා රු.53,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර එම කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම

---

(i) සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය වැඩිහිටි කමිටු 340 ක් ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල 10 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 04 ක් සහ පළාත් වැඩිහිටි බලමණ්ඩල 04 ක් වශයෙන් කමිටු 358 ක් පිහිටුවීමට රු.2,000,000 ක මුදලක් වෙන් කර තිබූ නමුත් සත්‍ය වශයෙන් පිහිටුවා තිබුණේ ග්‍රාමීය වැඩිහිටි කමිටු 325 ක් ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල 03 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 01 ක් සහ පළාත් වැඩිහිටි බලමණ්ඩල 02 ක් වශයෙන් කමිටු 330 ක් පමණි. එම කමිටු සඳහා රු.1,696,500 ක් වැයකර තිබූ අතර මුදල් ලබාගත් බව සනාථ කිරීම් වෙනුවෙන් එවන ලද රිසිට් පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ නමුදු වැඩිහිටි කමිටු පිහිටුවීම සඳහා ලබාදී තිබුණු මුදලින් රු.262,500 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපයෝජනය වී නොතිබුණි.

(ii) දිස්ත්‍රික් බල මණ්ඩලයකට ලබාදෙන රු.15,000 න් රු.7,500 ක් ද ප්‍රාදේශීය බල මණ්ඩලයකට ලබාදෙන රු.7,500 න් රු.5,000 ක් ද බැංකු ගිණුම් ආරම්භකිරීම සඳහා රඳවාගනු ලැබ තිබුණි. එම මුදල මුදල් ලැබී මාසයක් ඇතුළත සභාවට ලිඛිතව දැනුම් දිය යුතු වුවත් එම බල මණ්ඩල ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) මුදල් ලබාදීමේදී විධිමත්වූ ලේඛනයක් පවත්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එක් දිස්ත්‍රික්කයක කමිටු කොපමණ සංඛ්‍යාවකට මුදල් ලබාදී තිබුණේද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිවිය.

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම

--------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ වැඩිහිටි හැඳුනුම්පත් 80,000 ක් නිකුත් කිරීම සඳහා රු.600,000 ක් ප්‍රතිපාදන සළසා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වැඩිහිටි හැඳුනුම්පත් 581,020 ක් මුද්‍රණය කර තිබුණු අතර ඉන් හැඳුනුම්පත් 99,159 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව සෑම වර්ෂයකම ඉතිරිවන හැඳුනුම්පත් ඊළඟ වර්ෂය සඳහා නිකුත් කිරීමකින් තොරව අළුතින් මුද්‍රණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හැඳුනුම්පත් 481,861 ක් බෙදාහැරීමෙන් තොරව පැවතුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පදිංචි වැඩිහිටි පුද්ගලයන් හඳුනානොගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 246 ක් සඳහා වැඩිහිටි හැඳුනුම්පත් බෙදාහැර තිබුණද සමාලෝචිත වර්ෂයේ හැඳුනුම්පත් කිසිවක් නිකුත් නොකරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 85 ක් පැවතුණි.

(ඇ) අක්ෂි කාච සහ ශ්‍රවණ උපකරණ ලබාදීම

---------------------------------------------

සැළසුම් කළ ප්‍රමාණය ඉක්මවා අක්ෂි කාච 3693 ක් සහ ශ්‍රවණ උපකරණ 489 ක් දුෂ්කර හා ආබාධිත වැඩිහිටියන්ට ලබාදී තිබුණු බව දැක්වෙනත් එම උපකරණ ලබාගත් බව සනාථ කිරීම් සම්බන්ධයෙන් තොරතුරු පවත්වා නොතිබුණි.

## (ඈ) පුහුණු සහ දැනුවත්කිරීම් වැඩ සටහන්

---

(i) ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් නොවූ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සැකසීම සඳහා වූ විශේෂ ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.797,197 ක් වැය කර තිබුණද එම වියදම පුහුණු සහ දැනුවත්කිරීම් වැඩසටහනටම ඇතුළත් කර තිබුණි.

(ii) ග්‍රාමීය කාන්තා සංවිධාන හා පාසල් ළමුන්ට වැඩිහිටි අයිතිවාසිකම් සහ ඔවුන්ට සමාජයේ හිමිවිය යුතු ස්ථාන සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.2,317,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 120 ක මෙම වැඩසටහන් පවත්වා ඒ සඳහා රු.1,687,000 ක් වැය කර තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 211 ක එම වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර නොතිබූ බැවින් ඇස්තමේන්තු වටිනාකමින් රු.1,370,000 ක් උපයෝජනය කර නොතිබුණි.

(iii) මෙම වැඩසටහන යටතේ පාසැල් ළමයින්ට බෙදාදීම සඳහා රු.730,000 ක් වැයකර සටහන් පොත් (Pad book) 10,000 ක ප්‍රමාණයක් මුද්‍රණය කර තිබුණු අතර එම පොත් බෙදාහැරින ලද පාසැල් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## (ඉ) වැඩිහිටි සත්කාරක සේවය

---

සමාලෝචිත වර්ෂය තුළදී ගෘහස්ත සාත්තු සේවාවට ලංකාව පුරා සිටින පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුසු අය බඳවා ගෙන පුහුණුව ලබාදී රැකියාවට යොමුකර තිබුණු නමුත් එම පුද්ගල සංඛ්‍යාව කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. එසේම අනෙකුත් කාර්යන්වලින් වැඩිහිටියන්ට සිදුවී ඇති සේවාවන් හා අයවැය මගින් විශේෂ යෝජනාවක් ලෙස ඉදිරිපත්කර තිබුණු වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම

වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලින කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම සභාවේ එක් කාර්යයක් වූ අතර ඒ සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යායුතු බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශයක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වැඩිහිටි දිනය වූ ඔක්තෝබර් 01 දින වැඩිහිටි නිවාස, වැඩිහිටි කමිටු, වැඩිහිටි දිවා සුරකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි සංඛ්‍යාව ඇතුළත් කිරීමට සැළසුම් කර එම දත්ත අන්තර්ජාලයට ඇතුළත් කිරීමට වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ද දැනුවත් කර තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලින කර නොතිබුණි.

(උ) වැඩිහිටි දිනය පැවැත්වීම

සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 01 දිනට යොදා ගෙන තිබුණු ජාත්‍යන්තර වැඩිහිටි දිනය සඳහා රු.11,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.10,881,796 ක වියදම් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 97 ක වයස අවුරුදු 100 ඉක්මවූ වැඩිහිටියන් 150 ක් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 24 ක වයස අවුරුදු 75 ඉක්මවූ වැඩිම දරුවන් සිටින මාතාවන් 24 දෙනෙකුට සඳහා රු.10,000 ක බැගින් මුදල් ප්‍රදාන ලබාදී තිබුණු අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාල 38 කින් එම මුදල් ප්‍රදාන ලද බවට කුවිතාන්සි ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අදාල පුද්ගලයන්ට මුදල් ලැබුණු බවට තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි.

(ii) වැඩිහිටි දින උත්සවය සැමරීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාල 84 කට රු.2,215,500 ක් ලබාදී තිබුණු අතර එම වැඩසටහන් පැවැත්වූ බවට ප්‍රාදේශිය ලේකම් කාර්යාල 34 කින් වාර්තා ගෙන්වා නොතිබුණි.

(iii) මෙම උත්සවය සඳහා පැමිණෙන දමිළ වැඩිහිටියන් 24 දෙනෙකු පමණක් සහභාගිවී තිබුණද රු.82,000 ක් වැය කර භාෂා පරිවර්තන උපකරණ 100 ක් කුලියට ලබාගෙන තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(iv) වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි සතියක් ආරම්භ කර මුහුණත අගය රු.33,310,000 ක් වටිනා කොඩි 2,500,000 ක් සහ ස්ටිකර් 83,100 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට බෙදාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 20 දිනට ප්‍රථම මෙම කොඩි අලෙවිකර ලැබෙන මුදලින් සියයට 35 ක් හෙවත් රු.11,658,500 ක් වැඩිහිටි ලේකම් කාර්යාලයට ලබාදිය යුතු බව ලිඛිතව දක්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් ලබා ගැනීමට හෝ අලෙවි නොකරන ලද කොඩි සහ ස්ටිකර් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) වැඩිහිටි දිනයට සමගාමීව සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී , මාධ්‍ය මගින් වාර්තාමය වැඩ සටහන් විකාශය කිරීම, වියපත් භාවය පිළිබඳ කාලීන සංවාද පැවැත්වීම, වැඩිහිටියන්ගේ වටිනාකම විදහා දැක්වෙන වෙළඳ දැන්වීම් විකාශය කිරීම, මුද්‍රිත මාධ්‍ය තුළ නිතිපතා පළවන ලිපි පෙළක් සැකසීම සහ විද්‍යුත් මාධ්‍ය කාලසීමාවන් මිලදී ගනිමින් ඒවායේ වැඩිහිටි විෂය පථය සම්බන්ධව වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් කිරීම වෙනුවෙන් මාධ්‍ය වැඩ සටහන් පැවැත්වීමට පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන තිබුණද එම වැඩ සටහන් කිසිවක් පවත්වා නොතිබුණි.

කළමනාකරණ ක්‍රියාකාරකම්
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම
-----------------------------------------------------------------

ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වයස අවුරුදු 75 දක්වා වූ පොෂ්‍ය පුරවැසියන් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකිරීම සහ අවුරුදු 65 ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම යන යෝජනා දෙක ඇතුළත් කර වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බවට යෝජනා කර ඒ සඳහා රු.10,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා දිස්ත්‍රික්ක 25 සඳහා රු.2,438,715 ක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු අතර කාර්ය අවසානයෙන් පසුව ඔක්තෝබර් 10 දිනට පෙර අදහස් සහ යෝජනා වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුව තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී දිස්ත්‍රික්ක 16 ක වියදම් විස්තරද, දිස්ත්‍රික්ක 8 ක ප්‍රතිපත්තිය සැකසීමේ වාර්තාද සභාව විසින් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සභාව විසින් රු.797,197 ක් වැය කර තිබුණු අතර ඉදිරි කාර්යයන් සඳහා රු.2,253,065 ක් අමාත්‍යාංශයෙන් ලබාගෙන තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් එම මුදලින් රු.1,694,164 ක් අදාල කාර්ය උපයෝජනයකින් තොරව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2009 වර්ෂයේදී සභාව වෙත නැගි ඔප්පුවකින් ලැබී තිබූ අක්කර 02 ක් වූ නිවිතිගල, නිල්වලා සෙවන ආබාධිත මධ්‍යස්ථානයේ ඉඩම සහ ගොඩනැගිල්ල එම වර්ෂයේදීම රු.390,000 ක වියදම් කර පළිත්වැඩියා කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු කාර්යයක් සඳහා නොයොදා වසා දමා තිබුණි. ප්‍රයෝජනයට නොගැනීමේ හේතුව මත මෙම ඉඩම පැවරුම්ලාභියා නැවත ඉඩම ඉල්ලා නඩු පවරා තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 141 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 121 ක් වුවත් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 20 ක් පැවතුනි. 2011 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිලධාරී තනතුර 2017 ජූනි 12 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

4.5 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා ලබා දෙන රු.2,000 න් නැවත රු.100 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සභාව වෙත ලබා දී තිබූ අතර එම මුදලින් කළයුතු කාර්යයන් 10 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 30 දින අමප/16/0719/711/010 දරන කැබිනට් පත්‍රිකාව මගින් අනුමැතියද ලබාගෙන තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වාම ලැබී තිබූ රු.427,704,100 ක් ජංගම ගිණුමක තැන්පත් කර තිබුණු අතර අදාළ කාර්යයන් ඉටුකිරීමකින් තොරව ඉන් රු.389,000,000 ක් දෙසැම්බර් මාසයේදී ස්ථාවර තැන්පතු ගිණුමකට මාරු කර තිබුණි.

(ආ) වැඩිහිටි සුභසාධනය සඳහා රාජ්‍ය බැංකුවක පැවති රු.6,974,959 ක් වටිනා ස්ථාවර තැන්පතුවට අයත් පොලී මුදලින් රු. 10,000 බැගින් වකුගඩු රෝගීන් 30 කට ලබාදීමට පාලක සභාවේ අනුමතිය ලබාදී තිබුණි. කෙසේ නමුත් පොලී වශයෙන් ලද රු.441,267 ක් වූ මුදල ආදායමට බැරකර දිස්ත්‍රික්ක 25 සඳහා රු.250,000 ක් පමණක් ලබාදී තිබුණි.

(ඇ) 2012 ජූනි 02 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් සභාව සතු රු.4,000,000 ක් වූ ස්ථාවර තැන්පතුව සුභසාධක අරමුදලක් බවට පත් කිරීමට නියෝගයක් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම තැන්පතු ශේෂය රු. 6,974,959 ක් වූ අතර එය සුභසාධන අරමුදලක් බවට පත්කර නොගෙන ස්ථාවර තැන්පතුවක් ලෙසම පවත්වා ගෙන තිබුණි .

4.6 විධිමත් පරිදි පවරානොගත් ඉඩම් සහ ගොඩනැගිලිවල ව්‍යාපෘති ආරම්භ කිරීම

2003 අගෝස්තු 22 දින සමාජ සේවා අධ්‍යක්ෂක විසින් කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයට අයත් සියලු නිශ්චල හා චංචල දේපල සභාවට ලබාදී අවුරුදු 12 ක කාලයක් ගතවී තිබුණි. එහෙත් එම ඉඩම හා ගොඩනැගිල්ල විධිමත් පරිදි මැනුම් කර ඔප්පුවක් සකස් කර පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අලුත්වැඩියා සහ ඉදිකිරීම් වෙනුවෙන් රු.11,974,436 ක් සභාවේ අරමුදලින් දරා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැළැස්ම

ක්‍රියාකාරී සැළැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපිව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණු අතර වර්ෂ කිහිපයක සිට සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකරකම් පනතේ කර්තව්‍යයන්ට සුදුසු ආකාරයට සකස් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 10 සිට සියයට 62 දක්වාවූ පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය කළමනාකරණ පාලන කාරනයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) නිසිපරිදි වත්කම් හා පරිත්‍යාග ගිණුම් ගත නොකිරීම. |
| | (ii) අත්තිකාරම් ලබාදීමේදී ඒවා අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වියදම් නොවී ආපසු ලද මුදල් ගිණුම්ගත නොවීමේ අවදානමක් පැවතීම. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

| | |
|---|---|
| (ආ) කාර්ය මණ්ඩලය | කාර්ය මණ්ඩල පුරප්පාඩු නොපිරිවීම හා කාර්ය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් කාර්ය සාධනයට බලපෑම් ඇතිවීම. |
| (ඇ) මූල්‍ය පාලනය | අරමුදල් ඌන උපයෝජිතව පැවතිම. |
| (ඈ) මෙහෙයුම් පාලනය | වැඩිහිටියන් ගේ අදහස් සමාජයට ලබාදිම.ශුභ සාධන කටයුතු සිදුවිම වැනි කාර්යය භාරයක් සිදුවිය යුතු වූවද. කම්ටු සඳහා මුදල් ලබාදිමෙන් පසුව එවැනි පසුබිමක් නිර්මාණය කර ඇතිබව තහවුරු කරගැනිමට පසුවිපරම් සිදුකර නොතිබීම. |

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூகவலுவூட்டல்,நலன்புரிமற்றும் கண்டிமரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE& KANDYAN HERITAGE

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கானதேசியசெயலகம்
# National Secretariat for Elders

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේඅංකය<br>எனதுஇல<br>My No | NSE/ACC/05/13 | ඔබේඅංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.07. 04 |

ලේකම්,
සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය.

මහින්ද සෙනෙවිරත්න
ලේකම්
සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා
කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
01 වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

**<u>වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමු කරන ලද අංක එල්ඊඩබ්/සී/එන්සීඊ/1/16/21 හා 2016.06.15 දිනැති විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි නිරීක්ෂණ කාරුණිකව ඉදිරිපත් කරමි.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) පාරිතෝෂිත ප්‍රතිපාදන වෙන් කිරිමේ ගිණුමට අදාලව ශේෂය 2017 වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරමි.

(ආ) කතරගම ඉදිකිරීම් සම්බන්ධ වූ වියදම් වෙනුවෙන් වූ ගොඩනැගිලි ගිණුමට හා ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීමේ ගිණුමට අදාල ශේෂයන් විගණනයේ එකඟත්වය පරිදි 2017 වර්ෂයේදී සංශෝධනය කිරීමට කටයුතු කරමි.

(ඇ) මේ වන විට කතරගම සංචාරක නිකේතනය, කතරගම වැඩිහිටි නිවාසයේ හා එච්ජීන් නෝනා වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ඒවායේ වෙළඳපොළ වටිනාකම් ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. 2017 අවසන් ගිණුම් මඟින් මෙම වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බවද,
නිවිතිගල නිල්වලා සෙවන අබාධිත මධ්‍යස්ථානයට අයත් ඉඩම නිවිතිගල පාරවත්ත හන්දිය පදිංචි වස්තු කංකානම්ලාගේ ගුණතිලක අය විසින් තෑගි ඔප්පුවක් ලෙස හෝමාගම උතුරු පිටිපන, අංක 146 දරණ තැන ප්‍රධාන කාර්යාලය පිහිටි නිල්වලා සෙවන අබාධිත රැකවරණ මධ්‍යස්ථානයේ සභාපති මංජු ශ්‍රී දිසානායක සහ එහි ලේකම් තිලක් ප්‍රියන්ත අබේනායක යන අය වෙත පවරන ලද අතර ;මෙම ඉඩම ඔවුන් විසින් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී.උක්ත ඉඩම සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත පවරා ඇත. අදාල තෑගි ඔප්පුව ලබා දිමේදී ඉඩම හිමි වස්තු කංකානම්ලාගේ ගුණතිලක අය විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලින් 02 වැනි කොන්දේසිය ප්‍රකාරව එම ඉඩම වෙනත් අයෙකුට පැවරිය නොහැකි හෙයින් අදාල ඉඩමේ ඔප්පුව නැවත සමාජ සේවා දෙපාර්තමේන්තුව

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊමේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2187045
කාර්යාලය / அலுவலகம் / Office : 3094543
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

වෙත ලබා දීමට කටයුතු කර ඇත. එසේ වුවද මේ වන විට අදාල ඉඩම උක්ත කොන්දේසිය කඩ වීම හේතුකොටගෙන තමා වෙත පවරා දෙන ලෙස වස්තු කංකානම්ලාගේ ගුණතිලක යන අයගේ පුතනුවන් විසින් රත්නපුර දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර ඇත.ඒ අනුව එම නඩුවේ නඩු තීන්දුව අනුව ඉදිරියේ දී කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

(ඇ) විගණනයේ එකඟත්වය පරිදි 2017 වර්ෂයේදී සංශෝධනය කිරීමට කටයුතු කරමි.

(ඉ) භාණ්ඩාගාර ප්‍රදාන ගිණුමේ ශේෂය 2017 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

- මේ වන විට අවසන් වැඩ වාර්තා හා අවසන් බිල්පත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 කින් ලැබී ඇති අතර මෙතෙක් වාර්තා ලබා නොදුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත දැනුවත් කිරීම් සිදු කර ඇති අතර , එම වාර්තා ලද විගස ඔබ වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

### 2.2.3 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) මුළු වියදම් ඇස්තමේන්තුව සකස් කිරීමට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවති.

(අ) 2016.12.31 දින වන විට සියලුම අත්තිකාරම් පියවීම් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) සියළුම නිළධාරීන් දැනුවත් කළ අතර එක් නිළධාරියෙකු හැර අනෙක් සියලුම නිළධාරීන් මේ වන විට වෛද්‍ය වාර්ථා ලබා දී ඇති අතර ලබා නොදුන් නිළධාරියාගේත් වෛද්‍ය වාර්ථාව ඉතා ඉක්මනින් ලබා දෙන බව ආයතනය වවත දැනුම් දී ඇත.

(ඈ) මෙතෙක් මෙම ආයතනයේ පරිගණක මිලදී ගැනීමේදී ගිණුම්ගත කර තිබුනේ යන්ත්‍රෝපකරණ වැය විෂය යටතේය. මේ අනුව 2016 වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමද මිලදී ගැනීමද එම වැය විෂය යටතේ සිදුකළ අතර 2017 වර්ෂයේදී පරිගණක වලට අදාල තොරතුරු පරිගනක වැය විෂය යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ ) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් මේ වන විට සකස් කරමින් පවතින වැඩිහිටි තැනැත්තන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකක ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් රජය වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

එසේම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් සකස් කරමින් පවතින වෙබ් අඩවිය මඟින් අනෙකුත් සංවිධාන හා පුද්ගලයින් වෙත අවශ්‍ය උපදෙස් ලබා දීමට පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වමි.

(ආ) මෙරට ජීවත් වන සියළුම වැඩිහිටියන් සම්බන්ධ තොරතුරු පද්ධතියක් ඇතුලත් වෙබ් අඩවියක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් නිර්මාණය කරමින් පවතී.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන අදාළ වෙබ් අඩවි නිර්මාණය මේ වසර අවසන් වීමට ප්‍රථම අවසන් වනු ඇත. ඒ සඳහා දත්ත ඇතුලත් කිරීම මේ වන විට සිදු කරමින් පවතී.

(ඇ) වැඩිහිටියන්ගේ ගැටළු වලට බලපාන සමාජීය ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්න සම්බන්ධව ජාතික සභාවේ විශේෂ අවධානය යොමුව ඇත.

ඒ අනුව දැනට අවුරුදු 70 වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ලබා දෙනු ලබන මාසික රු.2000/- දීමනාව සම්බන්ධව විධිමත් පර්යේෂණයක් සිදුකර අවසන් කර ඇත.

අදාල වර්ෂයේ තවත් පියවරක් ඉදිරියට නංවමින් කොළඹ විශ්ව විද්‍යාලය හා සම්බන්ධවෙමින් බස්නාහිර පළාත තුල පිහිටි වැඩිහිටි නිවාසයන්හි ජීවත් වන වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්වය සම්බන්ධ විශේෂ පර්යේෂණයක් සිදු කිරීමට නියමිතව ඇත. මේ සම්බන්ධ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017/07/07 දින කොළඹ විශ්ව විද්‍යාලයේදී පැවැත්වේ.

(ඈ) වැඩිහිටි තැනැත්තන්ට මුහුණ දීමට සිදුවන සියළුම සාමාජීය,ආර්ථික හා සංස්කෘතිකමය ප්‍රශ්න සම්බන්ධව දැනුවත් කිරීම උදෙසා 118 අති විශේෂ දුරකථන අංකය හඳුන්වා දී ඇත.

එසේම ජුනි 15 දිනට යෙදී තිබූ වැඩිහිටි හිංසන වැලැක්වීමේ දිනය වෙනුවෙන් දීප ව්‍යාප්ත ස්ටිකර් ව්‍යාපාරයක් ඇරඹූ අතර එහි ආරම්භක වැඩසටහන ගරු විෂය භාර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017/06/15 දින කොළඹ මධ්‍යම බස් නැවතුම් පොළ හා කොටුව දුම්රිය ස්ථානය පාදක කරගනිමින් පැවැත්වීමට කටයුතු කරන ලදී.

එමඟින් මෙරට ජීවත් වන සියළුම වැඩිහිටියන්ට තමන්ට සිදුවන සාමාජීය,ආර්ථික හා සංස්කෘතිකමය ප්‍රශ්න සම්බන්ධව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධව හා වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික සභාව මඟින් මෙරට සිදු කරනු ලබන සේවාවන සම්බන්ධව දැනුවත් කිරීම් සිදු කර ඇත.

(ඉ) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නඟා සිටුවීම සඳහා රජය හෝ අනෙකුත් ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා හෝ වෙනත් ක්‍රියාකාරකම් සියල්ල මෙම සභාව යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය හා සම්බන්ධීකරණය කරනු ලබන බව කාරුණිකව පෙන්වා දෙමි.
අදාල ආයතනය මඟින් දැනටමත් රජය විසින් වැඩිහිටි සුභසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු සියළුම ක්‍රියාකාරකම්දිපව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබනවා සේම ඒවායෙහි අධීක්ෂණ කටයුතු ද සිදු කරමින් පවතී.
එසේම එම ආයතනය දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල , දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු සහ වැඩිහිටියන් වෙනුවෙන් සේවා සපයනු ලබන අනෙකුත් ස්වේච්ඡා සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලයින් සම්බන්ධීකරණය කරමින් පවතින බව කාරුණිකව පෙන්වා දන්වමි.

(ඊ) වැඩිහිටි තැනැත්තන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජිත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ලංකාවේ ස්ථාපිත සියළුම වානිජ රක්ෂණ ආයතන නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් 2016/05/09 දින පැවැත්විය.

අදාල සාකච්ඡාවේදී වානිජ පරමාර්ථයෙන් ක්‍රියාත්මක පුද්ගලික අංශයේ රක්ෂණ ආයතන මේ සම්බන්ධව දක්වන ආකල්පය හේතූන් මත ඔවුන්ගේඉදිරිපත් වීම ඉතා අවම මට්ටමක පැවතිනි.

ඒ අනුව සමාජ ආරක්ෂණ අරමුදල සමඟ සම්බන්ධ වෙමින් නව රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව කාරුණිකව පෙන්වා දන්වමි.

(උ) අදාල කරුණ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කොට ඇති බව කාරුණිකව දන්වනු කැමැත්තෙමු.
ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත අත්තම්මා කෙටරින් ව්‍යාපෘතිය, දේශීය බෝග වගා ව්‍යාපෘතිය හා චක්‍රීය ණය අරමුදල් මඟින් වැඩිහිටි පුද්ගලයින් සඳහා ආදායම් ඉපයීමේ අවස්ථා සලසා දීමට කටයුතු කොට ඇත.
එසේම මෙම ආයතනයේ වෙබ් පිටුව මඟින් දැක්වීමටනියමිත වැඩිහිටියන් වෙනුවෙන් වෙන් වූ සේවා ස්ථාන හා රැකියා අවස්ථා මඟින් ඔවුනට රැකියා අවස්ථා උදා කර දීමේ වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට උත්සාහ දරන බව කාරුණිකව දන්වමි.

තවද දිවයින පුරා විසිරී සිටින වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් හෝ වැඩිහිටි විෂයභාර නිළධාරීන් හරහා දිවයින පුරා විසිරී සිටින සහජ හැකියාවන්ගෙන් යුක්ත වැඩිහිටියන් සම්බන්ධ නාමාවලියක් ප්‍රසිද්ධියට පත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

## (අ) <u>වැඩිහිටි කමිටු සඳහා මූලාධාර ලබා දීම</u>

I. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල, හා පළාත් වැඩිහිටි බලමණ්ඩල යන වැඩිහිටි සංවිධාන උදෙසා මූලාධාර සැපයීම සිදුකරනු ලබන්නේ අදාල වැඩිහිටි සංවිධානයන්හි ඉල්ලීම් මතය.
උක්ත වැය ශීර්ෂය යටතේ මිලියන දෙකක මුදලක් වෙන්කරන්නේ අදාල වැඩිහිටි සංවිධාන සඳහා මූලාධාර සැපයීම හා වැඩිහිටි වැඩිහිටි සංවිධාන සඳහා වන අනෙකුත් විශේෂිත කාර්යයන් වෙනුවෙනි.
ඒ අනුව, ලද ඉල්ලීම් අනුව ග්‍රමීය වැඩිහිටි කමිටු 325ක්, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 03 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 01 හා පළාත් වැඩිහිටි බලමණ්ඩල 02 ක් වශයෙන් මූලාධාර සැපයූ අතර, ඉතිරි මුදල් වැඩිහිටි සංවිධානයන්හි අනෙකුත් විශේෂිත කාර්යයන් වෙනුවෙන් වෙන්කර නිකුත් කළ බව කාරුණිකව සඳහන් කරමි.

II. 2016 වර්ෂයේ මුදල් ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල සහ ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල සඳහා මුදල් ලැබුණු බවට ලදුපත් ලබා ගන්නා ලද අතර ඊට අදාල මුදල් ශේෂ තහවුරු කර ගැනිමට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බැවින් ඉදිරියේදී ඒ පිළිබඳව ඔබ වෙත වාර්ථා කිරීමට කටයුතු කරමි.

III. 2016 වර්ෂය තුළ කමිටු සඳහා ලබාදෙන ලද මුදල් ආධාර පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලේඛණ සකස් කර ඇති අතර ඉදිරි වර්ෂ වලදී මෙම ලේඛණය දිස්ත්‍රික් මට්ටමන් සකස් කිරීමට කටයුතු කරමි.

IV. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව කරන ලද ඉල්ලීම් අනුව 2016 වර්ෂය තුළ වැඩිහිටි කමිටු සඳහා ලබාදෙන ලද මුදල් ආධාර සම්බන්ධව ශේෂ තහවුරුපත් ලැබෙමින් පවතින අතර සියලුම තොරතුරු කඩිනමින් ලබාගෙන ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

V. වැඩිහිටි කමිටු සාමාජිකයන් ඔවුන්ගේ කාර්යයන් සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් පවත්වනු ලබන අතර ,ඔවුන් නිතර රැස්වීම් ඔවුන්ගේ සුභ සාධනය සම්බන්ධව කටයුතු කරනු ලබන අතර මේ සඳහා අදාල ප්‍රදේශවල වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් ද සහභාගී කරවීමට අදාල කටයුතු සිදුකර ඇත. තවද මේ පිලිබඳව ඉදිරියේදී කාර්ය සාධන වාර්ථාවට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන බවද දන්වා සිටිමි.

## (ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරිම

I. හැඳුනුම්පත් නිකුත් කිරිම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු වන බැවින් මෙම කාඩ්පත් මිලදී ගැනිමෙන් පසුව ආයතනය මුද්‍රණය කර මුද්‍රිත කාඩ්පත් සහ ලැමිනේටින් කවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කරනු ලබයි. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම කාර්යය සඳහා නිකුත් නොකරන ලද ඉතිරි කාඩ්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රඳවා තබාගෙන ඇති අතර එම කාර්යාල විසින් ඉතිරි කාඩ්පත් ඊළඟ වර්ෂයේදි භාවිතා කිරිමට කටයුතු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

II. හැඳුනුම්පත් නිකුත් කිරිම සඳහා රු.600,000.00 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබුණි.එම වර්ෂයේදී පැවති ජනාධිපති ජංගම සේවාවන්ට සමගාමීව හැඳුන්ම්පත් නිකුත් කිරිමේදී එම හැඳුනුම්පත් සඳහා අවශ්‍ය ජායාරූප මුද්‍රණය කිරීම සඳහා වියදම් වූ අමතර මුදල අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දීමට සිදුවීම හේතුවෙන් එම මුදල විවිධ ආදායම් තුලින් ලබා ගැනීමට කටයුතු කල බව කරුණාවෙන් දන්වා සිටිමි.

III. 2016.12.31 දින වන විට සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යයේ නියැලී ඇති බව දන්වා සිටිමි.

## (ඇ) අක්ෂි කාච සහ ශ්‍රවණ උපකරණ ලබා දිම

➢ 2016 වර්ෂය සඳහා අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ගබා ගැනිමට සැලසුම් කරනු ලැබුයේ 2015 වර්ෂයේදි අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ මිලදී ගත් මිල ගණන් වලට අනුව වුවද , 2016 වර්ෂයේදි 2015 වර්ෂයට වඩා අඩු මුදලට අක්ෂිකාච මිල දී ගැනිමට හැකි විය. ඒ අනුව සැලසුම් කල ප්‍රමාණයට වඩා වැඩි ශ්‍රවණ උපකරණ සහ අක්ෂි කාච ප්‍රමාණයක් ප්‍රතිලාභීන් වෙත ලබා දිමට හැකි විය.

ශ්‍රවණ උපකරණ සහ අක්ෂිකාච ලබා ගත් බව සනාථ කිරීම සම්බන්ධව සියළුම බිල්පත් ගොනුවේ අමුණා ඇති අතර , ප්‍රතිලාභීන් අදාල උපකරණ ලබාගත් බව සනාථ කෙරෙන අත්සන් ලේඛන ද ගොනුවේ අමුණා ඇත.

## (ඈ) ස්වයං රැකියා ආධාර ලබා දිම

➢ මුදල් ලද බවට සනාථ කරන ලදුපත් මොරවැව සහ වව්නියා දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලැබී නොමැති අතර අනෙක් සියල්ල ලැබී ගොනුවට අමුණා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

පසු විපරම් වාර්තා පුද්ගලයින් 27 දෙනෙකුගේ පමණක් ලැබී නැති අතර ඉදිරියේදි ඒවා ලබා ගෙන ඔබ වෙත වාර්ථා කිරීමට කටයුතු කරමි.

## (ඉ) පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩ සටහන්

I. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරිම 2015 වර්ෂයේ ඉදිරිපත් වූ අයවැය යෝජනාවක් වූ අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2016 වර්ෂයේදි අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කොට තිබුණි. 2016.03.29 දින මෙම කාර්යය වැඩිහිටි ලේකම්

කාර්යාලය වෙත පවරා ඇත. අදාල ප්‍රතිපත්ති සෑදීම සඳහා මූලිකව ඉටුකල යුතු කාර්යන් විශාල සංඛ්‍යාවක් වූ බැවින් අදාල කාර්යන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් ඉටුකල යුතුවිය.

භාණ්ඩාගාරයෙන් අමාත්‍යාංශය වෙත අක් මුදල් ලබා දෙනතුරු සහ අදාල අරමුදල් මෙම කාර්යාලය වෙත නැවත ලබාදෙන තුරු තාවකාලිකව අදාල වියදම් පුහුණු හා දැනුවත් කිරීම් හි ඇතුලත් කරන ලද අතර අරමුදල් ලැබීමෙන් අනතුරු අදාල වියදම් පියවා ගැනීමට අදාලව එම ගිණුමට බැර කරන ලදී. 2016.12.31 දින වන විට එය නිවැරදි කොට ඇති බැව කාරුණිකව දන්වමි.

II. දිවයින පුරා පිහිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ල ආවරණය වන පරිදි කාන්තා සංවිධාන හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වීමට සැලසුම් කර තිබුණි.

එසේ සැලසුම් කරන ලද වැඩසටහන් පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 120 කින් පමණක් අදාල කාර්යය කිරිමට ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලද අතර එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 120 සඳහාම මුදල් ලබා දී උක්ත වැඩසටහන් සිදු කර පසු විපරම් වාර්ථා 100% ක් ගෙන්වා ගෙන සතුටුදායක අයුරින් කාර්යය නිම කොට තිබුණි.

එසේ වූවත් ඒකීය විධානයක් තුල පාලනය වන නිළධාරීන්ගේ හිඟතාවය මත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කටයුතු නිසි අයුරින් ඉටුකර ගැනීමේ අපහසුතාවය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 211 ක උක්ත වැඩසටහන් පැවැත් වීමට නොහැකි විය.

ඒ අනුව අදාල මුදල් උපයෝගි කර ගනිමින් තවත් වැඩසටහන් කිහිපයක් ඉටුකර ගැනීමට කටයුතු කල අතර ඉදිරියේදි ඒකීය විධානයක් සහිතව පාලනය වන නිළධාරින් පරිපූර්ණ වීමෙන් අනතුරුව සියළු කාර්යයන් 100% ක් ඉටු කරවා ගතහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

III. මෙම පොත් 2016 වර්ෂයේදී මුද්‍රණය කල ද එම පොත් වලට ඇතුලත් කරනු ලබන නිර්මාණ ඇගයීම 2017 වර්ෂයේ වැඩිහිටි දිනයට සමගාමීව පැවැත්වීමට සැලසුම් කර ඇති බැවින් 2017 වර්ෂයේ කාර්යය සාධන වාර්ථාවට ප්‍රගතිය ඇතුලත් කිරීමට කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි.

## (ඊ) වැඩිහිටි සත්කාරක සේවය

➢ වැඩිහිටි සත්කාරක සේවය සඳහා බඳවාගෙන පුහුණුව ලබා දි ඇති පුද්ගල සංඛ්‍යාව මෙම වර්ෂයේ කාර්යය සාධනය සඳහා ඇතුලත් කරන බවද ,ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර එය අවසන් වූ විගස කාර්ය සාධනය සඳහා ඇතුලත් කරන බව කාරුණිකව සඳහන් කරමි.

## (උ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම

➢ නිලධාරින් පුහුණු කිරිම සඳහා UNFPA ආයතනය විසින් අරමුදල් විශ්ව විද්‍යාල වෙත මුදාහැර නොතිබෙන බැවින් දත්ත ඇතුලත් කිරිම සම්බන්ධව නිලධාරින් පුහුණු කිරීම් ප්‍රමාද වී ඇත. එම නිසා අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, කොළඹ විශ්ව විද්‍යාලය සහ UNFPA ආයතනය සමඟ සාකච්ඡා පවත්වමින් සිටි. මේ පිළිබඳව ඉදිරියේදි මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය මත පුහුණුවීම් කටයුතු ආරම්භ කරන අතර ඉන් පසුව දත්ත යාවත්කාලින කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

## (ඉ) වැඩිහිටි දිනය පැවැත්වීම

I. ප්‍රාදේශී ලේකම් කාර්යාල මගින් තහවුරු කිරීම් වලට අදාල තොරතුරු අප වෙත ලැබී ඇති අතර , මේ වන විට තහවුරු කිරීම් ඉදිරිපත් නොකල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි හා දුරකථන මාර්ගයෙන් දැනුම් දීම් සිදු කර ඇති අතර ඉදිරියේදී මෙම තොරතුරු ලද විගස විගණනය වෙත ඉදිරිපත් කරමි.

II. මේ වන විට වැඩසටහන් පැවැත් වූ බවට වාර්ථා 75 ක් ලද අතර ,වාර්ථා ලබා නොදුන් ආයතන වෙත වාර්තා ලබා දිමට කටයුතු කරන ලෙස දන්වා යවා ඇති අතර එම වාර්ථා ලද විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

III. ජාත්‍යන්තර වැඩිහිටි දිනය වෙනුවෙන් පැවති සමරු වැඩසටහන සඳහා දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි වැඩිහිටියන් 1000 ක් නියෝජනය කෙරිණි.

- මෙයින් උතුරු නැගෙනහිර නියෝජනය කරන ලද දමිළ භාෂාව කථා කරන වැඩිහිටියන් ප්‍රමාණය 24 ක්ද එයට අමතරව නුවරඑළිය දිස්ත්‍රික්කයේ බහුතර ප්‍රමාණයකුත් මාතලේ යන දිස්ත්‍රික්කයේ සුළුතර ප්‍රමාණයකුත් දමිළ භාෂාව කථා කරන පිරිසක් විය. ඒ අනුව අදාල භාෂා පරිවර්ථන උපකරණ උක්ත වැඩිහිටියන්ගේ භාවිතය උදෙසා ලබා දුන් අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය අනුගමනය කරමින් මෙම උපකරණ භාවිතයට ලබා ගන්නා ලද බව කරුණාවෙන් පෙන්වා දෙමි.

IV. අලෙවි නොකර කොඩි සහ ස්ටිකර් විනාශ කිරීමට අදාල කටයුතු ඉතා ඉක්මනින් අවසන් කර ඔබ වෙත වාර්තා කිරීමට කටයුතු කරමි.

V. සමාලෝචිත වර්ෂයේදි ඉලක්ක ගත වැඩසටහන් වෙනුවෙන් ක්‍රියාත්මක වීමේදී 100% ලගා කර ගැනිමට හැකියාව නොලැබුනද ,

- ව්‍යපත්භාවය පිලිබද කාලින සංවාද
- මුද්‍රිත මාධ්‍ය තුල දැන්වීම් පළකිරිම ආදිය සිදුකරන්නට යෙදුනි.
- ගුවන් විදුලි හා රූපවාහිනි වැඩසටහන්

එසේම වෙන්ව තිබු ප්‍රතිපාදන පදනම්ව,
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යභාර්ය සම්බන්ධව සංෂිප්ත වැඩසටහනක් නිර්මාණය කිරිමටද කටයුතු කරන ලදී. එසේම මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය කාලසීමාවන් මිළදී ගැනීම උදෙසා වෙන් වී තිබු ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අදාළ මාධ්‍ය ආයතනයන්හි මධ්‍ය කාල සීමාවන්හි අයකිරීම් ඉතා ඉහ අගයක් ගන්නා බැවිනි.

එසේ වුවත් 2017 වර්ෂයේදි මාධ්‍ය ආයතන සමහ සම්බන්ධ වෙමින් නව මාධ්‍ය වැඩසටහන් නිර්මාණය කිරිමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වමි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

## (අ) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සැකසීම

I. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරිම උදෙසා සැලසුම් කරන ලද කාලසීමාව 2016 ජුනි - 2016 දෙසැම්බර් දක්වායි. මෙම මාස 06 තුල දිස්ත්‍රික් හා සියළු

නිලධාරීන් සිය කාර්යයට අමතරව මෙම කාර්යය සඳහා ද දායකත්වය සපයමින් ප්‍රතිපත්තියේ කටයුතු අවසන් කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස 2017.06.05 වන දින වන විට ප්‍රධාන මෙහෙයුම් කමිටුවේ අවසන් වාර්තාවන් ලබා ගැනීමට නියමිතව තිබූ අතර , මේ වන විට එම කාර්යයද අවසන් වී ඇත.

II. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ අවසන් අදියරේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.අදාල කාර්යයන් සිදු කිරීම භාෂා පරිවර්ථන ගාස්තු මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ගාස්තු ,ප්‍රකාශන ගාස්තු , අවසන් ප්‍රකාශිත ගාස්තු සහ ප්‍රතිපත්තිය හඳුන්වාදීමේ ගාස්තු වූ ඉදිරියේ දී වැඩිහිටි ප්‍රතිපත්තිය වෙනුවෙන් දැරිය යුතු වියදම් දැරීම වෙනුවෙන් අමාත්‍යාංශය මඟින් ලද මුදලින් රු.1,694,164/- ක මුදලක් විවිධ තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති බව කාරුණිකව සඳහන් කරමි.

(ඇ) මේ සඳහා දැනට වෙනත් වියදම් දැරීම නවතා ඇති අතර එම නඩු තීන්දුවට අනුව ඉදිරියේදී කටයුතු කරමි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

- පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

## 4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මෙම මුදල් වියදම් දැරීම සඳහා මේ වන විටත් නීති හා රෙගුගාසි මාලාවක් සකස් කර ඇතත් පාලක සභාව විසින් එය අනුමත කර නොමැත. 2017 මැයි මස තිබූ සභාව මගින්ද ඊලඟ සභාව වෙත වැඩිදුර අධ්‍යයනය සඳහා යොමුකර ඇති බැවින් නීති හා රෙගුලාසි මාලාව අනුමත වූ පසුව වියදම දැරීමට අවශ්‍ය කටයුතු ඉටු කරමි.

(ආ) ඉතිරි වී ඇති මුදල මෙම වර්ෂයේදී බෙදා දීමට කටයුතු කර ඇත.

(ඇ) මෙම තැන්පතුව සුබ සාධන අරමුදලට යොමු කර ඇති අර එහි වාර්ෂික පොලිය පිළිකා ආධාර ලබා දීම සඳහා යොමු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.

## 4.5 විධිමත් පරිදි පවරානොගත් ඉඩම් සහ ගොඩනැගිලිවල ව්‍යාපෘති ආරම්භ කිරීම

- කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයට අයත් ඉඩම මේ වන විට මිනුම්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනුම් කටයුතු සිදු කර මිනුම්දෝරු සැලසුම ලබා දී ඇති බවත් , එම ඉඩම පවරා ගැනීමට අදාල කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

- 2016 වර්ෂයේ සිට අවුරුදු 05 ක ඉදිරි කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.

## 5.2 ක්‍රියාකාරි සැලැස්ම

- ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එක් එක් කාර්යයන් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි.

## 5.3 අයවැය ලේඛණමය පාලනය

- මුදල් අමාත්‍යාංශයෙන් වෙන්වූ අයවැය සීමාවන් මත ජාතික සභාවේ අනුමැතියෙන් එක් එක් වැය විෂයන් සඳහා මුදල් වෙන්කර කටයුතු කරන ලද අතර, වර්ෂ අවසානයේදී ප්‍රතිපාදන ඉතිරිවේ යැයි බලාපොරොත්තු වන සහ අවමවේ යැයි බලාපොරොත්තු වන වැය විෂයන් අතර සහා අනුමැතිය මත මාරු කිරීම් මඟින් අයවැය සීමා වෙනස්කර ගනිමින් වියදම් දැරීමට අනුමැතිය ලබාගන්නා ලද අතර, එම අනුමැතීන් මත වියදම් දරන ලද බව කාරුණිකව පෙන්වා දෙමි.

## 6. පද්ධති පාලනය

**(අ),(ආ),(ඇ),(අ)**

- පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණක විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලද අතර, ඒවා තවදුරටත් විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරන බව කාරුණිකව දන්වා සිටිමි.



සුවින්ද එස් සිංගප්පුලි
අධ්‍යක්ෂ